# ශ්‍රී ලංකා නාවික හමුදා ආචාර ධර්ම සංග්‍රහය



2026 ජනවාරි මස 01

# ශ්‍රී ලංකා නාවික හමුදා ආචාර ධර්ම සංග්‍රහය

**නිකුත් කල දිනය: 2026 ජනවාරි මස 01**

## පටුන


1. හැඳින්වීම

2. නාවික හමුදාවේ දැක්ම

3. නාවික හමුදාවේ මෙහෙවර

4. නාවික හමුදාවේ කාර්යය සහ කර්තව්‍ය

5. මූලික හර පද්ධතිය (වටිනාකම්)

6. නාවික හමුදා ආචාර ධර්ම සංග්‍රහය අනුගමනය කල යුතු පුද්ගලයින්

7. නාවික හමුදාව තුල නාවික පුද්ගලයෙකුගේ භූමිකාව

7.1 නාවික හමුදා රාමුවට අනුගත වී නාවික රාජකාරීන් සිදු කිරීම

7.2 සිවිල් පුද්ගලයින් සමඟ රාජකාරි සිදු කිරීමේදී නාවික පුද්ගලයෙකුගේ භූමිකාව

7.3 රාජකාරීයේදී සහ ඉන් බැහැරව වෘත්තීය ගරුත්වය පවත්වා ගැනීම

8. ආචාර ධර්ම සහ සුපිළිපන්නභාවය

8.1. මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ මානුෂීය හැසිරීම්

8.1.1 මානුෂිකත්වයට සහ පුද්ගල අභිමානයට ගරු කිරිම

8.1.2 සිවිල් පුරවැසියන් ආරක්ෂා කිරිම

8.1.3 නාවික හමුදා භාරයේ සිටින රැඳවියන්ට මානුෂීයව සැලකීම

8.2. අල්ලස් සහ දූෂණ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම

8.3. බැඳියාවන් අතර ගැටුම් වලක්වා ගැනීම

8.4. මූල්‍යමය විනිවිදභාවය

8.5. නාවික හමුදාව සතු තොරතුරු වල ආරක්ෂිතභාවය සහ සන්නිවේදනය

8.5.1 නාවික හමුදාව සතු රහසිගත තොරතුරු ආරක්ෂා කිරිම

8.5.2 සමාජ මාධ්‍ය භාවිතය සඳහා මාර්ගෝපදේශ

8.5.3 මාධ්‍ය සමඟ සම්බන්ධතා පැවැත්වීම

**8.6.** ප්‍රසම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය

**8.6.1** ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සිදු කල යුතු කරුණු

**8.6.2** ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සිදු නොකල යුතු කරුණු

**8.6.3** මූල්‍ය කළමනාකරණයේ වගකීම්

**8.7.** තොරතුරු වාර්තා කිරීම සහ එකී තොරතුරු වාර්තා කල හැකි පුද්ගලයින් සහ තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරිම

**8.7.1** තොරතුරු වාර්තා කල හැකි අවස්ථාවන්

**8.7.2** තොරතුරු වාර්තා කල හැකි පුද්ගලයින්

**8.7.3** තොරතුරු ලබා දෙන්නන්ගේ ආරක්ෂාව

**8.8.** නාවික පුද්ගලයින්ගේ වෘත්තීය - ජීවිත සමතුලිතතාවය පවත්වා ගැනීම

**8.9.** සියලුම නාවික පුද්ගලයින් හට ඔවුන්ගේ නිලය, තරාතිරම සහ තනතුරට අනුව නිසි ලෙස සැලකිම

**8.10.** පවතින නීතීන්, විනය සහ මාර්ගෝපදේශයන් කඩකිරීම් වාර්තා කිරීම් සම්බන්ධව වගවීම සහ බලාත්මක කිරීම

**8.10.1** නාවික පුද්ගලයින් වගවිය යුතු ආකාරය

**8.10.2** උල්ලංඝණයන්ට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග

**8.11.** නාවික පුහුණුව තුලින් සුපිළිපන්නභාවය වර්ධනය කිරීම

## 1.0 හැඳින්වීම

ශ්‍රී ලංකා නාවික හමුදාවට අනුයුක්තව රාජකාරි සිදුකරන සියළුම නාවික පුද්ගලයින් හා සිවිල් පුද්ගලයින් නාවික හමුදාවෙහි පවතින නාවික පනත, රෙගුලාසින්, නියෝගයන්, නාවික හමුදා සංදේශයන්, අනෙකුත් සංදේශ සහ ස්ථාවර නියෝගයන්ට අනුගතව රාජකාරි කරනු ලබයි. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධි විධානයන්ට අනුගත වෙමින් ආචාරධර්ම අනුව සෑම නාවික පුද්ගලයෙකුටම නාවික හමුදා ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දෙනු ලබයි. මෙම ආචාර ධර්ම සංග්‍රහය මඟින් ඉහත සඳහන් කිසිදු ලේඛනයක් අභිබවා යාමක් සිදු නොවන අතර මෙමගින් සියළුම නාවික හා සිවිල් පුද්ගලයින් සුපිළිපන්න භාවයෙන් යුක්තව සිය රාජකාරි සිදුකිරිම අපේක්‍ෂා කෙරේ.

## 2.0 නාවික හමුදාවේ දැක්ම

ශ්‍රී ලංකාවට අයත් සාගරික සම්පත් ආරක්‍ෂා කරමින් එහි ජාතික ආරක්‍ෂාව තහවුරු කරනු වස් නොගැඹුරු සහ ගැඹුරු දියඹෙහිද අභියෝගයන්ට මුහුණ දිය හැකි ශක්තිමත් නාවික හමුදාවක් ලෙස වර්ධනය වීම.

## 3.0 නාවික හමුදාවේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්‍ෂාව තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවි, උපකරණ සහිතව නිසි පුහුණුව ලබමින්, සාගරික සම්පත් ආරක්‍ෂා කරමින් මහ මුහුදේ ආධිපත්‍යය රැකගත හැකි නාවික හමුදාවක් බවට පත් වීම.

## 4.0 නාවික හමුදාවේ කාර්යය සහ කර්තව්‍ය

රටක නාවික හමුදාවක් සම්බන්ධ විය හැකි සම්පූර්ණ මෙහෙයුම් පරාසය එක් අන්තයක ඉහළ තිව්‍ර යුධ සංග්‍රාමයන් ගේ සිට අනෙක් අන්තයේ මානුෂීය ආධාර සහ ආපදා සහන මෙහෙයුම් දක්වා පුළුල් පරාසයක විහිදේ. එකිනෙකට වෙනස් භූමිකාවන්ට බෙදිය හැකි මෙම පුළුල් පරාසයක විහිදුනු මෙහෙයුම් සිදු කිරීම සඳහා නිශ්චිත ප්‍රවේශයක් අවශ්‍ය වේ. ඒ අනුව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ භූමිකාවන්, හමුදාමය, රාජ්‍ය තාන්ත්‍රික සහ නීතිය බලාත්මක කිරීම වශයෙන් ප්‍රධාන කොටස් තුනක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

## 5.0 මූලික හර පද්ධතිය (වටිනාකම්)

1. **ගෞරවය -** ගෞරවය යනු නාවික හමුදාවේ සහ නාවික පුද්ගලයන්ගේ කීර්ති නාමය රැකෙන පරිදි කටයුතු කිරීම රඳා පවතින මූලික වටිනාකමයි. ගෞරවය නාවික පුද්ගලයින්ගේ සදාචාරාත්මක ප්‍රමිතීන් පිලිබිඹු කරයි. එමෙන්ම ඒ තුලින් නාවික හමුදා පුද්ගලයින්ගේ ක්‍රියාවන්ට මග පෙන්වනු ලබන ඇතැම් නීතිරීති වලටද සිදු කල නොහැකි සදාචාරාත්මකභාවය සහ ආත්ම ගෞරවය ආදීන් පිලිබිඹු කරයි.

2. **අවංකභාවය -** සෑම නාවික පුද්ගලයෙකුම තමාට, නැව් මුළුවට සහ අනෙකුත් පුද්ගලයින්ට සත්‍යවාදී විය යුතුයි. සෑම නාවික පුද්ගලයෙකුම අනෙක් පුද්ගලයින් සමග විවෘතව සහ අවංකව කටයුතු කල යුතුයි. අවංකභාවය තුලින් පැහැදිලි හෘද සාක්ෂියකින් සහ පරාර්ථකාමිත්වයෙන් සේවය කිරීමට හැකියාව ලබා දෙයි.

3. **සුපිළිපන්නභාවය -** සුපිළිපන්නභාවය යනු කුමන ප්‍රතිඵලයක් ලැබුනත් සෑමවිටම නිවැරදී දේ සිදු කිරීමට කැපවීමයි. සුපිළිපන්නභාවයෙන් යුත්

නාවික පුද්ගලයින් ලෙස හැමවිටම තමාට ලැබෙන ප්‍රතිවිපාක කුමක් වුවත් වැරදි ක්‍රියාවන් නතර කිරිමට කටයුතු කල යුතුය.

4. **විශ්වාසනීයභාවය -** විශ්වාසනීයභාවය යනු තම රාජ්‍යයටත්, එකිනෙකාටත් සේවය කිරිමේ වගකීමට කැපවීමයි. විශ්වාසනීයත්වය තුලින් ජාතියට සහ එකිනෙකාට ඇති අන්‍යෝන්‍ය බැඳීම පිලිබිඹු කරයි. විශ්වාසනීයභාවය තුලින් තමා සමග රාජකාරි කරන පුද්ගලයින් අතර ඇති වගකීම සහ වගවීම වර්ධනය කරයි.

5. **ධෛර්යය -** ධෛර්යය යනු අනතුරුදායක හෝ දුෂ්කර අවස්ථාවන්හී දී නිවැරදිව නොබියව මුහුණදීමයි. නාවික පුද්ගලයෙකුගේ ධෛර්යය ඔහු තුල ඇති වගකීම, නිහතමානිකම සහ පෞද්ගලික ආදර්ශය මගින් පිලිබිඹු කරයි. නාවික පුද්ගලයෙකු තුල කෙතරම් අධ්‍යාපනයක් හෝ පළපුරුද්දක් තිබුණත් ධෛර්යයේ ඌනතාවයන් ජයගත නොහැක. නාවික පුද්ගලයෙකුගේ භෞතික හා සදාචාරාත්මක නිර්භීතකම මත ධෛර්යය රඳා පවතී.

## 6.0 නාවික හමුදා ආචාර ධර්ම සංග්‍රහය අනුගමනය කල යුතු පුද්ගලයින්

1. සියලුම නිලධාරීන් සහ නාවිකයින්.

2. නාවික හමුදා කඳවුරුවලට අනුයුක්තව රාජකාරි සිදුකරනු ලබන සියලුම සිවිල් සේවකයින්.

3. නාවික හමුදාව සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වන සියළුම බාහිර පුද්ගලයින්.

## 7.0 නාවික හමුදාව තුල නාවික පුද්ගලයෙකුගේ භූමිකාව

1. සෑම නාවික පුද්ගලයෙකුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියට අනුකූලව අවංකව කටයුතු කිරීම.

2. නාවික පුද්ගලයෙකු ලෙස ශ්‍රී ලංකාව තුල වෙනම රාජ්‍යයක් පිහිටුවීමට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටතදී ආධාර දීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්යය දීම හෝ දේශනා කිරීම සිදු නොකිරීමට කටයුතු කිරීම.

3. මාතෘභූමිය පිළිබඳ අභිමානයෙන් යුතුව තම මෙහෙවර ඉටු කිරීම.

4. දූෂණ විරෝධී කටයුතු වලදී ස්වේච්ඡාවෙන් ඉදිරියට පැමිණ නිර්භීතව කටයුතු කිරීම.

5. ආදර්ශවත් ලෙස නායකත්වය ලබාදීම මඟින් අනෙක් නාවික පුද්ගලයින් හට මාර්ගෝපදේශකයෙක් වීම.

6. නාවික පුද්ගලයෙකු යම් ධූරයක සිදුකරන රාජකාරි සුපරීක්ෂාකාරීවද, අනලස්වද ඉටු කල යුතු අතර, නාවික හමුදාවේ මනා පාලනය උදෙසා නීති, ආඥා, නියෝග හා උපදෙස් අනුව තමාගේ ධූරයට පහත් නිලධරයන් හා වෙනත් තැනැත්තන් පුහුණු කොට විනයගරුක පුද්ගලයින් බිහි කිරීමට කටයුතු කිරීම.

7. රාජකාරි ස්ථානයන්හි සාර්ථකත්වය සඳහා දායක වීම තමන් සතු වගකීමක් ලෙස සලකා කටයුතු කිරීම.

8. සෑම කාර්යයක්ම සිදු කිරීමේදි ධනාත්මක චින්තනයකින් යුතුව කටයුතු කිරීම.

9. අනෙකුත් නාවික පුද්ගලයින් හට වෘත්තීමය භාවයෙන් ඉදිරියට යාමට සහ දැනුම වර්ධනය කිරීමට උපකාරී විම සහ මඟ පෙන්වීම.

10. රාජකාරී සිදු කරන සෑම අවස්ථාවකදීම ස්වයං ආරක්ෂාව මෙන්ම උපකරණ වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම.

11. යම් කිසි සිවිල් වරදක් සම්බන්ධව පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන අධිකරණයෙහි නඩු කටයුතු සිදු කෙරේ නම්, ඒ සම්බන්ධව අණදෙන නිලධාරී මඟින් නාවික හමුදා මූලස්ථානය දැනුවත් කිරීමට කටයුතු කිරීම.

7.1. **නාවික හමුදා රාමුවට අනුගත වී නාවික රාජකාරීන් සිදු කිරීම**

1. සියලුම නීත්‍යානුකූල නියෝග කාලෝචිතව හා නිවැරදිව අනුගමනය කිරිම.

2. අරමුණ පැහැදිලි නොවන නියෝගයක් ලැබුවහොත්, ඒ සබැඳිව වගකිවයුතු නිලධාරියෙකුගෙන් විමසා උපදෙස් ලබා ගැනීම.

3. ලැබෙන නියෝගයන් නාවික හමුදාවේ පවතින නීතී රාමුවන්ට අනුකූල නොවන බව හැඟෙන්නේ නම් ඒ පිළිබඳව නිසි බලධාරින්ට රපොර්තු කිරිම.

4. නාවික හමුදාවේ පවතින නීති රීති වලට යටත්ව පමණක් තම රාජකාරීන් ඉටු කිරීමට සෑම විටම උත්සාහ කිරීම.

5. හඳුන්වා දී ඇති තාක්‍ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් කාර්යක්‍ෂම සේවාවක් පවත්වා ගැනීම.

**7.2. සිවිල් පුද්ගලයින් සමඟ රාජකාරි සිදු කිරීමේදී නාවික පුද්ගලයෙකුගේ භූමිකාව**

1. රාජ්‍ය නායකත්වයට, ධූරාවලියට සහ ප්‍රජාත්‍රාන්ත්‍රවාදයට ගරු කිරීම.

2. දේශපාලන කටයුතු වලට සම්බන්ධ නොවීම.

3. අනුමත ප්‍රජා සංවර්ධන උත්සාහයන්ට සෘජුව දායක වීම.

4. අවශ්‍ය අවස්ථාවන් වලදි පැහැදිලි සහ නිවැරදිව වෘත්තීයමය තොරතුරු සැපයීම.

5. නාවික හමුදා නියෝග කඩ නොවන ආකාරයෙන් සිවිල් පුද්ගලයින් සමග සෑම විටම කටයුතු කිරීම.

6. දූෂණ විරෝධි සිවිල් පුද්ගලයන් හඳුනා ගැනීමේදී නිතරම පොලීසිය සමග එක්ව කටයුතු කිරීමෙන් ඇතිවන බාධක අවම කර ගැනීම.

7. දීර්ඝ කාලීනව කටයුතු කිරීමේදී ඇති කර ගනු ලබන විවිධ සබඳතා මත නාවික විනයට හා මනා පාලනයට පටහැනි ක්‍රියාවන් වෙත යොමු නොවීම.

### 7.3. රාජකාරියේදී සහ ඉන් බැහැරව වෘත්තීය ගරුත්වය පවත්වා ගැනීම

1. නාවික හමුදා නිල ඇඳුමට ගැළපෙන වෘත්තීමය හැසිරීමක් පවත්වා ගැනීම.

2. සැම විටම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමානාත්මතාවයට මුල්තැන දෙමින් කටයුතු කිරීම.

3. නාවික හමුදා සම්පත් වගකීමෙන් හා වගවීමෙන් යුතුව භාවිතා කිරිම.

4. සාම්ප්‍රදායික ක්‍රම මෙහෙයුම් භාවිතයෙන් ඔබ්බට ගොස් නව තාක්‍ෂණික සහ උපාය මාර්ගික විසඳුම් මත කාර්යක්‍ෂමතාවය වැඩිදියුණු කිරීම.

5. පෞද්ගලික ජීවිතය තුලද පවතින නීතීන්ට සහ ආචාර ධර්ම වලට අනුගතව කටයුතු කිරිම.

6. නාවික පුද්ගලයින් නාවික හා සිවිල් නීතිය යන දෙකටම යටත්ව සිටින බැවින් ඒ පිළිබඳව නිසි අවධානයෙන් යුතුව සැම විටම රාජකාරි කටයුතු සිදු කිරීම.

7. සමාජ මාධ්‍ය තුල වගකීමෙන් යුතුව කටයුතු කිරිම.

8. සමාජයට ධනාත්මක දායකත්වයක් ලබාදිමට සැම විටම කටයුතු කිරිම.

9. නාවික පුද්ගලයෙකු වශයෙන් ශ්‍රී ලංකාව තුළින් විෂ මත්ද්‍රව්‍ය භාවිතය මුලිනුපුටා දැමීමට අවශ්‍ය සහයෝගය සහ සක්‍රීය දායකත්වය ලබා දීම.

## 8. ආචාර ධර්ම සහ සුපිළිපන්නභාවය

### 8.1. මානව හිමිකම් ආරක්‍ෂා කිරීම සහ මානුෂීය හැසිරීම්

#### 8.1.1. මානුෂිකත්වයට සහ පුද්ගල අභිමානයට ගරු කිරිම

1. සැම පුද්ගලයෙකුටම මානව හිමිකම් එක හා සමානව හිමිවෙයි.

2. අවශ්‍ය අවස්ථාවන්හිදි අවම බලය පමණක් භාවිතා කිරීම.

3. නාවික පුද්ගලයෙකුගෙන් හෝ නාවික හමුදාව සම්බන්ධ කටයුත්තකදී යම් පුද්ගලයෙකුගේ මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුවුවහොත් නාවික හමුදාව වෙතද එහි වගකීම පැවරේ.

#### 8.1.2. සිවිල් පුරවැසියන් ආරක්‍ෂා කිරීම

1. සියලුම පුරවැසියන් සමඟ ගෞරවයෙන් හා ආචාරශීලීව හැසිරිම.

2. සිවිල් පුරවැසියන්ගේ දේපල හා ජීවිත ආරක්‍ෂා කිරීම.

3. ඔවුන්ගේ දෛනික ජීවිතයට බාධාවක් ඇති නොවන පරිදි කටයුතු කිරීම.

### 8.1.3. නාවික හමුදා භාරයේ සිටින රැඳවියන්ට මානුෂීයව සැලකීම

1. නිසි අත්අඩංගුවට ගැනීමේ ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීම.

2. ප්‍රමාණවත් ආහාර, ජලය, ආරක්ෂාව සහ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම.

3. ඔවුන්ගේ නීතිමය අයිතිවාසිකම් සුරැකීම.

4. අත්අඩංගුවේ සිටින පුද්ගලයන් පිළිබඳ නිසි ලේඛණ පවත්වා ගැනිම.

5. රැඳවියන්ගෙන් හෝ ඔවුන්ගේ සමීපතමයින්ගෙන් අල්ලස්, ලාභ ප්‍රයෝජන ලබාගැනීමේ අරමුණින් ඔවුන් හට උපකාර සහ අවශ්‍ය උපදෙස් ලබා නොදීම.

6. කිසිවිටෙකත් ශාරීරික හෝ මානසික වධහිංසා, ලිංගික අපයෝජනය හෝ අවමන් සහගත ලෙස කටයුතු නොකිරීම.

## 8.2 අල්ලස් සහ දූෂණ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම

1. අල්ලස් සහ දූෂණ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම සඳහා නාවික හමුදා පුද්ගලයකු විසින් අනුගමනය කලයුතු ක්‍රියාවන්.

අ. යම් නිල ක්‍රියාවක්, වෘත්තීය තීරණයක් හෝ පරිපාලන ක්‍රියාකාරකමක් මත බලපාන ලෙස යම් අයෙකුට අයුතු වාසියක් ලබා දීම, ලබා ගැනීම, ඉල්ලා සිටීම හෝ එවන් වාසියක් ලබාදීමට යෝජනා කිරීම අල්ලස් ලෙස සැලකේ.

ආ. ඒ අනුව යම් රාජකාරි කටයුත්තක් ඉටු කිරීම, එය කඩිනම් කිරීම, ප්‍රමාද කිරීම, බාධා කිරීම හෝ එය ඉටු කිරීමෙන් වැලකීම සඳහා පෙළඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස කිසියම් තුටු පඬුරක් (මුදල්, දේපළ, අනුග්‍රහය ආදිය) ඉල්ලා සිටීමෙන් හෝ පිළිගැනීමෙන් වැලකී සිටිය යුතුය.

ඇ. අල්ලස් ලබා දීම, ලබා ගැනීම සහ ඉල්ලා ගැනීම යන සියලු ආකාරයේ ක්‍රියා දැඩිවිනයානුකූල වරදවල් වන අතර, අදාළ නීති යටතේ දඬුවම් ලැබිය හැකි අපරාධයකි. මෙම නියමයන් උල්ලංඝනය කිරීම රාජ්‍ය සේවයේ විනයානුකූල රීති, අනෙකුත් අදාල නීති මෙන්ම දූෂණ විරෝධී පනතට යටත් වන වරදක් ලෙස සැලකේ.

ඈ. දූෂණ යනු, රජයට නීති විරෝධී අලාභයක් සිදු කිරීමට හෝ තමන් වෙත හෝ වෙනත් කෙනෙකු වෙත නීති විරෝධී වාසියක් ලබා ගැනීමේ අදහසින් තම තනතුර අයුතු ලෙස භාවිතා කර යම් ක්‍රියාවන් සිදු කිරීමයි.

ඉ. ඒ අනුව රජයට නීති විරෝධී අලාභයක් සිදු කිරීමට හෝ පෞද්ගලික වාසි සඳහා හෝ වෙනත් කෙනෙකුගේ වාසි තකා ස්වකිය තනතුර අයුතු ලෙස භාවිතා කර යම් ක්‍රියාවන් සිදු කිරීමෙන් වැලකී සිටිය යුතුයි.

ඊ. දූෂණයක් ලෙස සැක සහිත සෑම ක්‍රියාවක්ම නොපමාව අදාල බලධාරීන් වෙත දැනුම් දිය යුතුය.

උ. මෙම නියමයන් උල්ලංඝනය කිරීම රාජ්‍ය සේවයේ විනයානුකූල රීති, අනෙකුත් අදාල නීති මෙන්ම දූෂණ විරෝධී පනතට යටත් වන වරදක් ලෙස සැලකේ.

## 8.3 බැඳියාවන් අතර ගැටුම් වලක්වා ගැනීම

1. රාජකාරි බැඳීම් සහ පෞද්ගලික හෝ හිත–මිතුරු, නෑ සබඳතා හෝ ව්‍යාපාරික සබඳතා හේතුවෙන් ඇතිවන බැඳීම් අතර ගැටීමක් නොතිබිය යුතුය.

2. කිසියම් නිල තීරණයකට හෝ ක්‍රියාකාරකමකට බැඳියාවන් අතර ගැටුමක් පවතින විට හෝ පැවතිය හැකි බව දැනගත් විට, එය හැකි ඉක්මණින් තම උසස් අධිකාරිය වෙත වාර්තා කළ යුතුය.

3. එවැනි බැඳියාවන් අතර ගැටුමක් පවතින තීරණ ගැනීමේ කමිටුවක සාමාජිකයෙකු වීමෙන් වැළකිය යුතු අතර, නියමිත අධිකාරිය විසින් ඍජුව ලිඛිත අනුමැතිය ලබා දී ඇත්නම් පමණක් එම ක්‍රියාවලියට සම්බන්ධ විය යුතුය.

4. නිල වගකීම් හා ගැටෙන, හෝ රහස්‍ය නිල තොරතුරු පෞද්ගලික වාසියට භාවිතා කළ හැකි ව්‍යාපාර, අමතර රැකියා, වෘත්තීය කටයුතු වල නියලීම සිදු නො කළ යුතුය.

5. මෙම නියමයන් උල්ලංඝනය කිරීම රාජ්‍ය සේවයේ විනයානුකූල රීති, අනෙකුත් අදාල නීති මෙන්ම දූෂණ විරෝධී පනතට යටත් වන වරදක් ලෙස සැලකේ.

## 8.4 මූල්‍යමය විනිවිදභාවය

1. මූල්‍ය විනය පවත්වා ගෙන යාම සහ වත්කම් ප්‍රකාශ කිරීම

අ. අයථා ලෙස ආදායම් ඉපයීම හෝ වෙනත් මූල්‍ය අක්‍රමිකතාවකට අදාළ ඕනෑම ක්‍රියාවකින් වැළකී සිටිය යුතු අතර එවැනි ක්‍රියාවන්ට අනුබල දීමද නොකල යුතුය.

ආ. යම් නීති විරෝධී ආදායම් ඉපයීමයක් සම්බන්ධයෙන් දැනුමක් හෝ තොරතුරු ඇති ඕනෑම පුද්ගලයෙකු ඒ පිළිබඳ නිසි බලධාරියාට දැනුම් දිය යුතුය.

ඇ. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු පුද්ගලයින් තම ප්‍රකාශ දූෂණ විරෝධී පනත ප්‍රකාරව නිවැරදි කාල සීමාව තුල ලබා දිය යුතුය

ඈ. වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට අමතරව, තමා සතු වත්කම් අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී හෙළි කිරීම සියලුම නාවික පුද්ගලයින් සතු වගකීමකි.

ඉ. මෙම නියමයන් උල්ලංඝනය කිරීම රාජ්‍ය සේවයේ විනයානුකූල රීති, අනෙකුත් අදාල නීති මෙන්ම අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත සහ දූෂණ විරෝධී පනතට යටත් වන වරදක් ලෙස සැලකේ.

## 8.5 නාවික හමුදාව සතු තොරතුරු වල ආරක්ෂිතභාවය සහ සන්නිවේදනය

1. නාවික හමුදාව සතු රහසිගත තොරතුරු ආරක්ෂා කිරීම

අ. රාජකාරින් සඳහා අවශ්‍ය තොරතුරු සඳහා පමණක් ප්‍රවේශ විය යුතුය.

ආ. රාජකාරියේ යෙදී සිටින විටද එසේ නොමැති විටද, සෑම විටම තොරතුරු ආරක්‍ෂාව සහතික කිරීමට කටයුතු කල යුතුය.

ඇ. තොරතුරු පද්ධති ආරක්ෂාව පිළිබඳ කාර්ය මණ්ඩලය සහ පද්ධති භාවිතා කරන්නන් වගකීමෙන් බැඳී සිටිය යුතුය.

ඈ. නිල ලේඛනවල තොරතුරු හෝ පරිගණක යන්ත්‍ර වල ඇති මෘදුකාංග හා දත්ත පද්ධති වෙනස් කිරීම, පිටපත් කිරීම, විනාශ කිරීම හෝ අවසර නොලැබූ මෘදුකාංග ස්ථාපනය කිරීම තහනම් වේ.

ඉ. රහසිගත ලේඛණ හා දත්ත නිසි ලෙස ආරක්‍ෂිතව ගබඩා කල යුතුය.

ඊ. රහසිගත හෝ සංවේදී තොරතුරු හුවමාරු කිරීමේදී සහ පරිශීලනයේදී ආරක්ෂිත ක්‍රම වලට අනුගත වන්න.

උ. අවශ්‍ය විට නිසි බලධාරින්ගේ අවසරය මත නිසි ක්‍රමවේදයන්ට අනුව රහසිගත ලේඛණ විනාශ කිරිම.

ඌ. ජාතික ආරක්‍ෂාව සඳහා බලපාන සංවේදී තොරතුරු අනවසර හෝ අදාල නොවන පුද්ගලයින්ට ලබා නොදීම.

එ. රහසිගත හෝ සංවේදී තොරතුරු සම්බන්ධයෙන් ඇති ඕනෑම අවදානම් සහ සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර දැන ගත් විගස අදාළ නිලධාරීන්ට වාර්තා කරන්න.

2. සමාජ මාධ්‍ය භාවිතය සඳහා මාර්ගෝපදේශ

අ. නාවික හමුදාව සම්බන්ධ කිසිදු තොරතුරක් සමාජ මාධ්‍ය තුල උඩුගත නොකිරීමට කටයුතු කිරීම.

ආ. ආරක්‍ෂක මෙහෙයුම් හෝ සංවේදී කරුණු සම්බන්ධ තොරතුරු සමාජ මාධ්‍ය තුල උඩුගත කිරීම, සංසරණය සහ ප්‍රතිචාර දැක්වීම සිදු නොකිරිම.

ඇ. දේශපාලනික, ආගමික, ජාතිවාදී වැනි සමාජය ප්‍රකෝප කරවන සුළු අදහස්, ප්‍රකාශ, ඡායාරූප හෝ වීඩියෝ දර්ශන පල කිරීමෙන් වැළකීම.

ඈ. සමාජ මාධ්‍ය තුළ වෘත්තීය ගෞරවය රැකෙන අයුරින් කටයුතු කිරිම.

ඉ. ද්වේශසහගත/ අපහාසාත්මක/ තර්ජනකාරී ප්‍රකාශ සමාජ මාධ්‍ය තුල සිදුකිරිමෙන් වැලකිම.

3. මාධ්‍ය සමඟ සම්බන්ධතා පැවැත්වීම

මාධ්‍යට අදහස් ප්‍රකාශ කිරිමේදී නාවික හමුදාවේ පවතින නීතීන් හා රෙගුලාසීන්ට අනුව අවසරලත්/ නිල තොරතුරු පමණක් ප්‍රකාශ කිරිම සහ එම ප්‍රකාශයන් සෑම විටම සත්‍ය සහ සනාථ කර ඇති ප්‍රකාශයන් විය යුතුයි. තවද, මාධ්‍ය විමසීම් වලට නොපමාව ගෞරවයෙන් යුතුව ප්‍රතිචාර දැක්විම සිදු කල යුතුයි.

## 8.6 ප්‍රසම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය

1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සිදු කල යුතු කරුණු.

අ. සියළුම මිලදී ගැනීම් ක්‍රියාවලියන් මූල්‍ය රෙගුලාසි සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කිරිම.

ආ. පෞද්ගලික වාසි හෝ බැඳියාවන් මත මිලදී ගැනීම් තීරණය නොකිරිම.

ඇ. සැපයුම්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාව, විශ්වාසවන්ත භාවය සහ නීත්‍යානුකූල භාවය මත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරිම.

ඈ. සියළු ගණුදෙනු සහ ගිවිසුම් සම්බන්ධ අදාල ලේඛණ නිවැරදිව පවත්වාගෙන යාම.

ඉ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලදී භාණ්ඩ හා සේවාවන් සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් වල රහස්‍යභාවය හා විනිවිදභාවය සුරැකීම.

2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සිදු නොකල යුතු කරුණු

අ. සැපයුම්කරුවන්ට හෝ කොන්ත්‍රාත්කරුවන්ට අනීතික වාසි ලබා දීම.

ආ. නිසි නීතිමය අධීක්ෂණයන් මඟ හැර කොන්ත්‍රාත්තු ලබා දීම.

ඇ. වියදම් වැඩි කර පෙන්විම, අවශ්‍යතාවයන් නිසියාකාරව නොපෙන්වීම හෝ අවශ්‍යතා අතිවිශාල කර දැක්වීම.

3. මූල්‍ය කළමනාකරණයේ වගකීම්

අ. අනුමත මුදල් මගින් ගත හැකි උපරිම ප්‍රයෝජන ලබා ගැනීමටත් එම මුදල වැය කිරීම තුලින් ප්‍රතිලාභ ලබන අනිකුත් පුද්ගලයින් හට ලබාදිය හැකි උපරිම ප්‍රතිලාභ ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම.

ආ. සියලු මිලදී ගැනීම් සහ වියදම් ‘මුදල් සඳහා වටිනාකම’ මත පදනම්ව සිදුකිරිම.

ඇ. අනුමත මූල්‍ය සීමාවන් තුල පමණක් වියදම් කිරිම.

ඈ. සියලු ආකාරයේ වියදම් සිදු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලැබීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක වීම.

ඉ. සියලුම මූල්‍ය ගනුදෙනු සඳහා විස්තරාත්මක ලේඛණ පවත්වාගෙනයාම හා වාර්තා තබාගැනීම.

ඊ. විගණන සහ පරීක්ෂණ කටයුතු සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දීම.

## 8.7 තොරතුරු වාර්තා කිරීම සහ එකී තොරතුරු වාර්තා කල හැකි පුද්ගලයින් සහ තොරතුරු හෙළි කරන්නන් ආරක්‍ෂා කිරිම

### 8.7.1. තොරතුරු වාර්තා කල හැකි අවස්ථාවන්

1. අපරාධ ක්‍රියාකාරකම්

2. දූෂණය හෝ වංචාව

3. මානව හිමිකම් උල්ලංඝනය කිරීම

4. නාවික හමුදා නීතීන් සහ රෙගුලාසින් උල්ලංඝණය කිරීම.

5. තම ආයතනයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන ක්‍රියාවන්.

6. මෙම සංග්‍රහය උල්ලංඝණය කිරීම.

### 8.7.2. තොරතුරු වාර්තා කල හැකි පුද්ගලයින්

1. නාවික හමුදාධිපති, ආඥාපති, නියෝජ්‍ය ආඥාපති, දෙපාර්තමේන්තු ප්‍රධානී, අණදෙන නිලධාරී, වෙනත් වගකිවයුතු නිලධාරියෙකු, අංශභාර නිලධාරි හෝ අංශ ක්‍රමය යටතේ සිටින අංශභාර නාවිකයින් වෙත.

2. විනයාරක්ෂක අංශය වෙත.

3. අභ්‍යන්තර කටයුතු ඒකකය වෙත.

### 8.7.3. තොරතුරු ලබා දෙන්නන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම හා වගවීම

1. සෑම විටම තොරතුරු ලබා දෙන්නන්ගේ නම, ලිපිනය සහ පුද්ගලික තොරතුරු හෙළි නොකිරීම තුලින් ඔවුන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම.

2. තොරතුරු ලබා දෙන්නන් සේවයෙන් ඉවත් කිරීම, තනතුරු පහළ දැමීම සහ අසාධාරණ මාරු කිරීම් වැනි පළිගැනීම් වලින් එම පුද්ගලයින්ගේ වෘත්තියට අහිතකර බලපෑමක් ඇති නොවන ලෙස ආරක්ෂා කිරීම.

3. තොරතුරු ලබා දෙන්නන් හට ඇති වන ඕනෑම ගැටළුවකදී නීතිමය වශයෙන් ආරක්ෂාව ලබාදීම.

4. ආයතන තුල සිදුවන වංචා හා දූෂණය අවම කිරීම තුලින් තොරතුරු ලබා දෙන්නන්ගේ විශ්වසනීයභාවය ලබාගැනීම.

## 8.8 නාවික පුද්ගලයින්ගේ වෘත්තීය - ජීවිත සමතුලිතතාවය පවත්වා ගැනීම

1. තමා යටතේ සිටින නාවික පුද්ගලයින් කාලීනව සම්මුඛ පරීක්ෂණයන්ට භාජනය කිරීම.

2. නාවික පුද්ගලයින් අනවශ්‍ය ලෙස පීඩනයට පත් නොකිරීම.

3. සියළුම නාවික පුද්ගලයින්ගේ වෘත්තීය - ජීවිත සමතුලිතතාවය පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දීම.

4. නාවික පුද්ගලයින්ගේ පරිපාලනය හා සුභසාධනය පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලීම.

**8.9 සියලුම නාවික පුද්ගලයින් හට ඔවුන්ගේ නිලය/ තරාතිරම සහ තනතුරට අනුව නිසි ලෙස සැලකිම**

1. නාවික හමුදාව තුල ඇති සෑම නිලයකටම/ තරාතිරමකටම නිසි ක්‍රමවේදයන්ට අනුව සැලකීම.

2. නාවික හමුදාවේ සියලුම අංශයන් වෙත සාධාරණ අවස්ථාවන් ලබාදීම.

**8.10 පවතින නීතීන්, විනය සහ මාර්ගෝපදේශයන් කඩකිරීම් වාර්තා කිරීම් සම්බන්ධව වගවීම සහ බලාත්මක කිරීම**

1. **නාවික පුද්ගලයින් වගවිය යුතු ආකාරය**

    අ. වාර්තා වන සියලුම උල්ලංඝණයන් වගකිව යුතු නිලධාරියෙකු වෙත වාර්තා කිරිම.

    ආ. වැරදි හැසිරීම් නිරීක්ෂණය කිරිම.

    ඇ. සිද්ධීන් නිසි ලෙස විමර්ශනය කිරිම.

    ඈ. සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනිම.

    ඉ. නිසි නායකත්වය තුළින් උල්ලංඝණයන් වැලැක්විම.

2. **උල්ලංඝණයන්ට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග**

    අ. පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම (උපදෙස් දීම, අවවාද කිරීම).

    ආ. නාවික හමුදා පනතට අනුව කටයුතු කිරීම.

    ඇ. සිවිල් නීතිය හා අපරාධ නීතිය යටතේ නඩු පැවරීම.

    ඈ. මූල්‍යමය අලාභයන් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීම.

**8.11 නාවික පුහුණුව තුලින් සුපිළිපන්නභාවය වර්ධනය කිරීම**

1. සෑම නාවික පුද්ගලයෙකුටම පහත අවස්ථාවන්හීදි පුහුණුව තුලින් සුපිළිපන්නභාවය ලබා කර ගැනීම අපේක්ෂා කරයි.

    අ. සියලු නාවික පුද්ගලයින්ගේ මූලික පුහුණුව, වාර්ෂික පුහුණු හා නායකත්ව පුහුණු පාඨමාලා මගින්.

    ආ. වාර්ෂික සිදු කරණු ලබන පුහුණු සැසියන් මගින්.

    ඇ. රාජකාරි ස්වාභාවය අනුව ලබාදෙන විශේෂිත පුහුණු මගින්.

    ඈ. ඒ ඒ අංශ අනුව සිදු කරණු ලබන පුහුණු පාඨමාලාවන් මඟින්.

9.0 මෙම ආචාර ධර්ම සංග්‍රහය හුදෙක් මඟ පෙන්වීමක් පමණක් නොවන අතර, එය බැඳීමකි. මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, තත්කාලීනව අදාලවන සියලු නීති රීති, අනු නීති, විධිවිධාන, චක්‍රලේඛ, ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා රීති, මූල්‍ය නියාමන (මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ) සහ බලධාරී අධිකාරින් විසින් නිකුත් කරන වෙනත් උපදෙස් හා නියමයන් සමඟ ඒකාබද්ධව එකී නීතිවලට අනුව ක්‍රියාත්මක විය යුතුය.

10.0 නාවික නීතියට යටත් නාවික පුද්ගලයින්, නාවික හමුදා කඳවුරු වලට අනුයුක්තව රාජකාරි සිදුකරනු ලබන සියලුම සිවිල් සේවකයින් සහ නාවික හමුදාව සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වන සියළුම බාහිර පුද්ගලයින් මෙම ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති කරුණු මැනවින් අවබෝධ කරගෙන අනුගමනය කරන බවට සහතික කිරීමේ වගකීම සියළුම පුද්ගලයින් හට පැවරේ.

11.0 ඔබ විසින් ගනු ලබන සෑම තීරණයක්ම, සෑම ක්‍රියාවක්ම, ඔබ ගැන පමණක් නොව, සමස්ත නාවික හමුදාවේම අනන්‍යතාවය සහ ගෞරවය පිළිබිඹු වෙන බැවින් සෑම විටම නිවැරදි තීරණ ගැනිමට වගබලා ගත යුතු අතර ආදර්ශවත්, වෘත්තීයභාවය හා ගෞරවය පදනම් කරගත් වෘත්තීය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ක්‍රියාශීලීව දායක විය යුතුය.

12.0 මෙම ආචාර ධර්ම සංග්‍රහය අනුගමනය කිරීම මගින්, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ශ්‍රී ලාංකීය ජනතාව වෙත විශ්වාසනීය, ගෞරව සම්ප්‍රයුක්ත සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීම සහතික කෙරෙනු ඇත.

13.0 සියළුම නාවික පුද්ගලයින් මෙම ආචාර ධර්ම සංග්‍රය කියවා බලා තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කල යුතුය.

14.0 මෙම ආචාර ධර්ම සංග්‍රහය සෑම වසරකට වරක්ම නාවික හමුදා අධ්‍යක්ෂ ජෙනරාල්වරුන් සහ ප්‍රාදේශිය බලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබාගෙන ඒ අනුව යාවත්කාලීන කිරීම සිදුකල යුතුය.